# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2176/5 - 2020 මැයි මස 19 වැනි අඟහරුවාදා - 2020.05.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

64 (1) වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 64(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම බණ්ඩාරවෙල මහා නගර සභාව විසින් පවත්වා ගෙන යනු ලබන බණ්ඩාරවෙල මහා නගර සභා ජල සම්පාදන ක්‍රමයේ ජල සැපයීම කටයුතු සම්බන්ධයෙන් එකී පනතේ 63 (1) වන වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ විධිවිධාන මෙම නියමය මගින් මෙහි පහත උපලේඛනයේ ඇතුළත් කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 අප්‍රේල් මස 22 වැනි දින,
අංක 35,
"ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

1A - G 32247 — 38 (2020/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

61 (1) වගන්තිය - ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමයේ ඇතුළත් දේ.

(අ) පහත දැක්වෙන සියලුම චංචල හා නිශ්චල දේපළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා මණ්ඩලය සතුකළ යුතුය. එනම් ඃ

(i) උපලේඛන 01, 02, 03 හි සඳහන් සියලුම ජල මූලාශ්‍ර ජල කුළුණු පීඩන සිඳින ටැංකි හා පොම්ප කිරීමේ ස්ථාන ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට අවශ්‍ය සියලුම ඉඩම් ගොඩනැගිලි, ජල නල, සියලුම යාන්ත්‍රික හා විදුලි යන්ත්‍රෝපකරණ සවි කිරීම් ද, යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමට අවශ්‍ය සියලුම අමතර කොටස් අතුරු උපකරණ හා ගබඩා ද්‍රව්‍ය

(ii) බණ්ඩාරවෙල මහා නගර සභා සීමාව තුළ පිහිටි ජලය බෙදාහැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු කිරීම පිළිබඳව බණ්ඩාරවෙල මහා නගර සභාව විසින් බැඳී ඇති කවර හෝ කොන්ත්‍රාත්තු ද, සභාවේ අයිතිවාසිකම්, බැඳීම හා වගකීම් මණ්ඩලය වෙත පවරණු ලැබේ.

(ආ) ඉහත සඳහන් දේපළ හා සම්බන්ධව සැලසුම් කිරීම, සවි කිරීම් ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳව බණ්ඩාරවෙල මහා නගර සභාව විසින් බැඳී ඇති කවර හෝ කොන්ත්‍රාත්තු ද, සභාවේ අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් මණ්ඩලය වෙත පවරණු ලැබේ.

(ඇ) ජලය භාවිතා කිරීම හා ජල සේවා සැපයීම සම්බන්ධයෙන් ජල පාරිභෝගිකයින් සමග බණ්ඩාරවෙල මහා නගර සභා බැඳී ඇති සියලුම ගිවිසුම් ද ඒ සේවාවන් ලබාගැනීම සම්බන්ධයෙන් කළයුතු ගෙවීම් ද මණ්ඩලය වෙත පවරනු ලැබේ.

(ඈ) රුපියල් 7,320,850.00 (රුපියල් හැත්තෑතුන් ලක්ෂ විසි දහස් අටසිය පනහක්) වටිනා මේ පහසුකම්වල වත්කම් ආධාර මුදලක් වශයෙන් රජය විසින් මණ්ඩලය වෙත ප්‍රදානය කරනු ලැබේ.

(ඉ) ජලය සැපයීම් සම්බන්ධයෙන් නගර සභාව ඇතුළත් වූ සියලුම ගිවිසුම මණ්ඩලය විසින් නොකඩවා පවත්වාගෙන යනු ලබන අතර, ගිවිසුම සපුරාලීම ද කරනු ලැබේ.

ඉහත පැවරුම මෙම නිවේදනය පළ වූ දින සිට ක්‍රියාත්මක වනු ඇත.

*උපලේඛනය අංක 01*

| අනු අංකය | විස්තරය | ඉඩමේ පිහිටීම | ප්‍රමාණය | | | මිනින්දෝරු සැලසුම් විස්තරය | පළාත් පාලන ආයතනයකින් හිමිකම් ඔප්පු විස්තර |
|---|---|---|---|---|---|---|---|
| | | | අක්. | රූඩ් | පර්චස් | | |
| 1 | ජල මූලාශ්‍රය සහිත රක්ෂිත ඉඩම | බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැබිල්ලවෙල ගමේ පිහිටි නායබැද්දවත්ත නැමැති ඉඩම | 7 | 2 | 2.1 | අ.ග.පි 118 අතිරේක 05 පත්‍ර අංක 06හි කැබලි අංක 189, 191, 192, 195, 196, 197, 198, 199, 200, 201, සහ 202 | පැවරුම් සහතික අංක 149 මගින් 1953.07.11 වැනි දින බණ්ඩාරවෙල මහා නගර සභාව වෙත පැවරී ඇත. |
| | | | 0 | 0 | 23.5 | අ.ග.පි 118 අතිරේක 05 පත්‍ර අංක 06 හි කැබලි අංක 203 | |
| 2 | ජල ගබඩා ටැංකිය | බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැබිල්ලවෙල ගමේ පිහිටි අඹතැන්න වත්ත නමැති ඉඩම | 0 | 0 | 3.9 | ඒ. කේ. ආනන්ද ඩබ්ලිව්. ද සිල්වා බලයලත් මිනින්දෝරු තැන විසින් 1997.12.10 වැනි දින පිළියෙළ කරන ලද පිඹුරු අංක 522හි කැබලි අංක 01 | එම්. සී. ජයරාණී පීරිස් නොතාරිස්තුමිය විසින් 1997.12.13 සහතික කරන ලද ඔප්පු අංක 9491 |

*උපලේඛනය අංක 02*

| අනු අංකය | විස්තරය | පිහිටි ප්‍රදේශය |
|---|---|---|
| 1 | ජල පොම්පාගාරය | වැලිහෙලපතන |
| 2 | ඝන මීටර් 5ක ධාරිතාවකින් යුක්ත පීඩන සිදීන වැංකි 03 | නායබැද්ද |
| 3 | ඝන මීටර් 40ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | පූනාගල පාර |
| 4 | ඝන මීටර් 10ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | පූනාගල පාර |
| 5 | ඝන මීටර් 25ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | පූනාගල පාර |
| 6 | ඝන මීටර් 32ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | ඉනිකම්බැද්ද |
| 7 | ඝන මීටර් 55ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | අඹතැන්න වත්ත |
| 8 | ඝන මීටර් 20ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | අඹතැන්න වත්ත |
| 9 | ඝන මීටර් 22ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | සුරම්‍යගම |
| 10 | ඝන මීටර් 45ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | බණ්ඩාරවෙල තානායම අසල |
| 11 | ඝන මීටර් 195ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | ධර්මපාල මාවත |
| 12 | ඝන මීටර් 15ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | වලස්බැද්ද |
| 13 | ඝන මීටර් 30ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | වැලිහෙලපතන |
| 14 | ඝන මීටර් 31ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | ගෙඩියරොද |
| 15 | ඝන මීටර් 20ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | සේනානායක මාවත |
| 16 | ඝන මීටර් 20ක ධාරිතාවකින් යුක්ත ජල ගබඩා ටැංකිය | වැලමඩ පාර |

*උපලේඛනය අංක 03*

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | කි.මී. 7.5ක් දිග සම්ප්‍රේෂන නල මාර්ගය | අඟල් 4 |
| 2 | කි.මී. 0.2ක් දිග සම්ප්‍රේෂන නල මාර්ගය | අඟල් 3 |
| 3 | කි.මී. 0.9ක් දිග සම්ප්‍රේෂන නල මාර්ගය | මි.මී. 200 |
| 4 | කි.මී. 3ක් දිග බෙදාහැරීමේ නල මාර්ගය | මි.මී. 160 |
| 5 | කි.මී. 3.95ක් දිග බෙදාහැරීමේ නල මාර්ගය | මි.මී. 110 |
| 6 | කි.මී. 7.4ක් දිග බෙදාහැරීමේ නල මාර්ගය | මි.මී. 90 |
| 7 | කි.මී. 25.6ක් දිග බෙදාහැරීමේ නල මාර්ගය | මි.මී. 63 |
| 8 | කි.මී. 8.2ක් දිග බෙදාහැරීමේ නල මාර්ගය | මි.මී. 50 |
| 9 | කි.මී. 0.9ක් දිග බෙදාහැරීමේ නල මාර්ගය | මි.මී. 40 |
| 10 | කි.මී. 4.17ක් දිග බෙදාහැරීමේ නල මාර්ගය | මි.මී. 32 |
| 11 | කි.මී. 0.3ක් දිග ප්‍රධාන නල මාර්ගය | මි.මී. 63 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.